# <u>මධ්‍යම පළාත්, පළාත් පාලන ආයතන වල පුස්තකාලයාධිපති සේවයේ නිලධාරීන්ගේ</u>

# <u>වාර්ෂික ස්ථානමාරු පරිපාටිය</u>

## 01. හැඳින්වීම

ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන පරිදි, මධ්‍යම පළාත් පළාත් පාලන ආයතන වල සේවයේ නිරත පුස්තකාලයාධිපති සේවයේ නිලධාරීන් සඳහා මෙම ස්ථාන මාරු පරිපාටිය අදාල වේ. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලද දින සිට මෙම පරිපාටිය ක්‍රියාත්මක වේ.

## 02. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය

2.1 වාර්ෂික නොවන ස්ථාන මාරු.

පහත දැක්වෙන අවස්ථා වලදී, පළාත් පාලන කොමසාරිස් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කරන අතර,එය ස්ථාන මාරු ප්‍රතිපත්තියට ඇතුලත් නොවේ.

i. පරිපාලනමය හා සේවා අවශ්‍යතාවය මත කළ යුතු මාරු කිරීම්
ii. විනය හේතු මත කෙරෙන ස්ථාන මාරු කිරීම්
iii. සාමාන්‍ය රාජකාරි කටයුතු වලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු කිරීම්
iv. විශේෂ වෛද්‍ය හේතු මත කෙරෙන මාරු කිරීම්
v. සේවකයින්ගේ හදිසි හා සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු හේතුවෙන් කෙරෙන මාරු කිරීම්

2.2 වාර්ෂික ස්ථාන මාරු

ඉහත වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ කෙරෙන ස්ථාන මාරුවීම් හැර, ස්ථාන මාරු වීම් අපේක්ෂා කරන නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන පරිදි, වාර්ෂික ස්ථාන මාරු වීම් කමිටු ක්‍රියාත්මක කෙරේ.

2.3 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වල,

i. පුස්තකාලයාධිපති අධි පන්තිය
ii. පුස්තකාලයාධිපති I පන්තිය
iii. පුස්තකාලයාධිපති II පන්තිය
iv. පුස්තකාලයාධිපති III පන්තිය

2.4 ස්ථාන මාරු සඳහා අදාල වන සේවා ස්ථානයක උපරිම කාල සීමාව

i. වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කිරීම
ii. වර්ෂ 04 ක් හෝ ඊට වැඩි කාලයක් ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කිරීම
iii. වර්ෂ 02 ක් හෝ ඊට වැඩි කාලයක් දුෂ්කර සේවා ස්ථානයක සේවය කිරීම

2.4.1. අධි පන්තියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලන ආයතන වල අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු මත ස්ථාන මාරු කිරීම මාරු මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015.09.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**03. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ සංයුතිය**

ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි, මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස් විසින් පිහිටුවනු ලබන වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් සමාජිකයින්ගෙන් සමන්විත වේ.

i. දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් තිදෙනා

ii. පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය)

iii. මුළු සේවක සංඛ්‍යාවෙන් 40% ක්, මධ්‍යම පළාත් පුස්තකාලයාධිපතිවරුන්ගේ නියෝජනයක් සහිත, ලියාපදිංචි වෘත්තීය සමිති (ජාතික මට්ටමේ නොවන) නියෝජනය කරමින් එක් නියෝජිතයෙකු බැගින්

3.1. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ මත ඔක්තෝබර් 01 දිනට පෙර වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ දැනුම් දීම

**04. අභියාචනා මණ්ඩලයේ සංයුතිය**

ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 5 වන වගන්තියේ සඳහන් විධිවිධාන පරිදි, අභියාචනා මණ්ඩලය පළාත් පාලන කොමසාරිස්ගෙන් හා පළාත් පාලන කොමසාරිස් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකුගෙන් සමන්විත වේ.

4.2. ස්ථාන මාරු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා පිළිබඳව මාරු මණ්ඩලයේ නිර්දේශයන් සැලකිල්ලට ගනිමින්, යෝග්‍ය තීරණයක් ගැනීමේ අභිමතය අභියාචනා මණ්ඩලය සතුවේ.

4.3. ස්ථාන මාරු නියෝගයට විරුද්ධව කරුණු දැක්වීම් අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කල හැකිවේ. එනම්,

i. මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරු කිරීම්

ii. නිලධාරීන්ගේ සාධාරණ ඉල්ලීම් ඉටු නොවුනු අවස්ථා

iii. නිලධාරීන්ගේ ඉල්ලීම් වලට පටහැනිව කර ඇති මාරු කිරීම්

iv. ස්ථාන මාරු වීම කර ඇති දිනයෙන් පසුව නිලධාරීන්ට සිදුවූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි ඉල්ලීම්

**05. ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන සුදුසුකම්**

i. ඉතා ප්‍රියමනාප ස්ථානයක අවුරුදු 05 ක සේවා කාලයක්ද, ප්‍රියමනාප ස්ථානයක අවුරුදු 04 ක සේවා කාලයක්ද, දුෂ්කර ස්ථානයක අවුරුදු 02 ක සේවා කාලයක්ද සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරු ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

ii. දුෂ්කර නොවන ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙක් දුෂ්කර සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම්, සේවා අවශ්‍යතාවයට යටත්ව එවැනි ස්ථාන මාරුවීමක් ලැබීමට සුදුසුකම් ලබයි.

iii. දුෂ්කර ස්ථානයකට වෙනත් ඉල්ලීමක් නොමැත්තේ නම්, නියමිත කාලයට වඩා වුවද එම ස්ථානයේ සේවය කරනු ලබන නිලධාරියාට තමා කැමති නම් දිගටම එම ස්ථානයේ සේවය කිරීමට ඉඩ දෙනු ඇත.

iv. ප්‍රියමනාප සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙක් දුෂ්කර සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවීමක් ලැබීමට සුදුසු වන්නේය.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/09/27 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## 06. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී අදාල වන කොන්දේසි

i. ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

ii. ස්ථාන මාරුවීම් අයැදුම් කිරීමේදි හා එම ස්ථාන මාරු වලට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව සකස් කර ඉදිරිපත් කරනු ලබන අයැදුම්පත් පමණි.

iii. වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සෑම නිලධාරියෙකුම අදාල ස්ථාන මාරු අයැදුම්පත්‍රය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුය. අයැදුම් නොකරන නිලධාරීන් ස්ථාන මාරු කිරීමට යටත් වන අතර, ඔවුන්ගේ අභියාචනා සලකා බලනු නොලැබේ.

iv. අවුරුදු 02 ක් හෝ ඊට වැඩි කාලයක් දුෂ්කර ස්ථානයක සේවය කරන නිලධාරියෙකුට දුෂ්කර නොවන ස්ථානයකට මාරුවීමක් දීමට සිදු වන අවස්ථාවක දී එම ස්ථානයෙහි වැඩිම සේවා කාලයක් ඇති නිලධාරියා ඉන් පිටතට මාරු කෙරේ.

v. නිලධාරියා මෙන්ම ඔහුගේ/ ඇයගේ පවුලේ අයටද ඇති වන අපහසුතාවය අවම කිරීමට හැකි වන සේ ස්ථාන මාරුවක් ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලයට පහසු වනු පිණිස නිලධාරීන් විසින් තමා ඉල්ලා සිටින සේවා ස්ථානයට අමතරව තවත් විකල්ප ස්ථාන 04 ක් ඉල්ලුම්පත්‍රයේ අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය.

vi. භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත නම් නිලධාරියාගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබා දීම පිළිබඳව සලකා බැලේ.

vii. දුෂ්කර කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී පාසැල් යන දරුවන් ඇති විවාහක නිලධාරීන්ට වඩා අවිවාහක නිලධාරීන්ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධාරීන්ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් වේ.

viii. දුෂ්කර නොවන සේවා ස්ථාන වල සේවය කරන නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බලනු ලබන්නේ දුෂ්කර සේවා ස්ථාන වල සේවය කරනු ලබන නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

ix. ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප ස්ථානයක සේවය කර ස්ථාන මාරු ලබා ගත් නිලධාරියෙකු වසර 10 ගත වන තුරු නැවත එම සේවා ස්ථානයට ස්ථාන මාරුවීමේ හිමිකමක් නැත.

x. දුෂ්කර සේවා ස්ථාන වල වසර 02 කට වඩා මීට පෙර සේවය කොට ඇති නිලධාරීන් වර්තමානයේ දුෂ්කර නොවන සේවා ස්ථානයක වසර 05 ක් සේවය කර ඇත්නම් ඔවුන්ද සේවා අවශ්‍යතාවය අනුව දුෂ්කර සේවා ස්ථානයකට වුවද ස්ථාන මාරු කිරීමට යටත්වේ.

xi. ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප සේවා ස්ථාන වල අදාල සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරියෙක් නැවත ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විට, එම ඉල්ලීම සලකා බලනු ලබනේන් දුෂ්කර සේවා ස්ථාන වල නිලධාරීන්ගේ එම ස්ථාන මාරු ලබා ගැනීමට ඉල්ලීමක් නොමැති වුවහොත් පමණි.

xii. ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප සේවා ස්ථාන වල ගත කළ කාලය ගණනය කිරීමේදී පූර්වාසන්න වසර 05 ක් තුළ සේවය කළ ඉතා ප්‍රිය මනාප හෝ ප්‍රිය මනාප සේවා ස්ථාන කිහිපයක වුවද සේවා කාලය එකතුව ගණනය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015.09.23 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

xiii. සේවා ස්ථාන වර්ගීකරණය පහතින් ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව නිලධාරීන් විසින් ස්ථාන මාරු ඉල්ලුම් කල යුතුය.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන වර්ගීකරණය | | |
|---|---|---|---|
| | ඉතා ප්‍රිය මනාප | ප්‍රිය මනාප | දුෂ්කර |
| මහනුවර | 1. මහනුවර මහ නගර සභාව.<br>2. ගම්පල නගර සභාව.<br>3. කඩුගන්නාව නගර සභාව.<br>4. වත්තේගම නගර සභාව නාවලපිටිය නගර සභාව.<br>5. ගඟවට කෝරළේ ප්‍රාදේශිය සභාව<br>6. හාරිස්පත්තුවප්‍රාදේශිය සභාව<br>7. යටිනුවර ප්‍රාදේශිය සභාව.<br>8. අකුරණ ප්‍රාදේශිය සභාව.<br>9. පාතදුම්බර ප්‍රාදේශිය සභාව<br>10. කුණ්ඩසාලේ ප්‍රාදේශිය සභාව | 1. උඩුනුවර ප්‍රාදේශිය සභාව<br>2. මැදදුම්බර ප්‍රාදේශිය සභාව<br>3. තුම්පනේ ප්‍රාදේශිය සභාව<br>4. පූජාපිටිය ප්‍රාදේශිය සභාව<br>5. පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාව.<br>6. උඩපළාත ප්‍රාදේශිය සභාව<br>7. පාතහේවාහැට ප්‍රාදේශිය සභාව | 1. උඩදුම්බර ප්‍රාදේශිය සභාව.<br>2. මිනිපේ ප්‍රාදේශිය සභාව<br>3. .ගඟඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව.<br>4. පන්විල ප්‍රාදේශිය සභාව. |
| මාතලේ | 1. මාතලේ මහ නගර සභාව<br>2. දඹුල්ල මහ නගර සභාව<br>3. උකුවෙල ප්‍රා.ස.<br>4. මාතලේ ප්‍රා.ස. | 1. ගලේවෙල ප්‍රාදේශිය සභාව..<br>2. යටවත්ත ප්‍රාදේශිය සභාව.<br>3. පල්ලේපොල ප්‍රාදේශිය සභාව..<br>4. නාඋල ප්‍රාදේශිය සභාව.<br>5. රත්තොට ප්‍රාදේශිය සභාව.<br>6. දඹුල්ල ප්‍රාදේශිය සභාව. | 1. විල්ගමුව ප්‍රා.ස.<br>2. ලග්ගල පල්ලේගම ප්‍රා.ස.<br>3. අඹන්ගඟ කෝරළේ ප්‍රා.ස. |
| නුවරඑළිය | 1. නුවරඑළිය ම.න.ස.<br>2. හැටන් දික්ඔය න.ස. | 1. තලවකැලේ ලිදුල නගර සභාව.<br>2. හඟුරන්කෙත ප්‍රාදේශිය සභාව.<br>3. නුවරඑළිය ප්‍රාදේශිය සභාව. | 1. වලපනේ ප්‍රාදේශිය සභාව.<br>2. අඹගමුව ප්‍රාදේශිය සභාව..<br>කොත්මලේ ප්‍රාදේශිය සභාව. |

xiv. ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියළුම නිලධාරීන් නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට බැදී සිටිය යුතුය.

xv. ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධාරියෙකු එම මාරු වීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මාරු පරිපාටියට පටහැනිය. ස්ථාන මාරු මණ්ඩලය මඟින් ස්ථාන මාරු කර ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි මුදා හැරීමට කටයුතු කල යුතුය.

xvi. ස්ථාන මාරු ලැබීමට ඉඩ ප්‍රස්ථා ඇතැයි සිතන කිසියම් නිලධාරියෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තම ආයතනයේ රඳවා ගත යුතු යැයි ආයතන ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිය ඉල්ලුම්පත්‍රය යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලි කර අදාල ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කල යුතුය. පළාත් පාලන කොමසාරිස් විසින් මාරු මණ්ඩලයට ඒ පිළිබඳව දැනුම් දී ක්‍රියා කරනු ඇත. එක් ආයතනයකට අනුයුක්ත නිලධාරි සංඛ්‍යාවෙන් 1/3 කට නොවැඩි නිලධාරි පිරිසක් සඳහා පමණක් මේ සඳහා ඉල්ලුම් කල හැකිය. එක් වතාවකදී මෙම අවස්ථාව ලබා දී ඇති නිලධාරියෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/09/22 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

xvii. නිලධාරියෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව කරුණු දැක්වීම් ඉදිරිපත් කිරීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානියාට හිමිකමක් නැත.

xviii. මාරු මණ්ඩලය විසින් නිලධාරීන් මාරු කිරීමේදී ඒ ඒ ආයතනයේ සේවා අවශ්‍යතාවයද, කාර්ය මණ්ඩල සමබරතාවය රැකීමටද , සේවා පළපුරුද්ද නිලධාරීන්ට ලබා දීමට සැලසීමටද හැම විටම උත්සහ කල යුතු වේ.

xix. පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල ශ්‍රේණිගත කිරීම් අනුව, එම ශ්‍රේණියට අදාල පුස්තකාලයාධිපතිවරුන් සෑම විටම යෙදිය නොහැකි අවස්ථාවක වෙනත් ශ්‍රේණියක පුස්තකාලයාධිපතිවරයෙකු වුවද ස්ථාන මාරු කල හැකිය.

**07.** වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | | | |
|---|---|---|---|
| i. | අයදුම්පත් කැඳවීම | - | ජූලි 15 |
| ii. | අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය | - | අගෝස්තු 15 |
| iii. | ස්ථාන මාරු මණ්ඩලය රැස්වීම | - | සැප්තැම්බර් 15 |
| iv. | ස්ථාන මාරු තීරණ දැනුම් දීම | - | ඔක්තෝබර් 01 |
| v. | අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය | - | ඔක්තෝබර් 15 |
| vi. | ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | - | නොවැම්බර් 01 |
| vii. | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම | - | ජනවාරි 01 |

08. මධ්‍යම පළාත් පළාත් පාලන ආයතන වල සේවයේ නිරත පුස්තකාලයාධිපති සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය 2015.08. දින රැස්වූ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

| නම | | අත්සන |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | .................... |
| 02. යු.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | .................... |
| 03. පි.පි.එස්.ඒ. දිසානායක මිය | (සාමාජික) | .................... |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | .................... |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | A. J. M. M. Nisathar |

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :

අනුමත කරමි/නොකරමි
..............................
සුරංගනී එල්ලාවල
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20.15/09/22.......

| |
|---|
| වාර්ෂික ස්ථාන මාරු |

# <u>මධ්‍යම පළාත්, පළාත් පාලන ආයතන වල පුස්තකාලයාධිපති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු අයදුම්පත්‍රය</u>

| තනතුර | | ඉ-මානව සම්පත් අංකය<br>( කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි) | |
|---|---|---|---|

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. සම්පූර්ණ නම | | | |
| 02. මුලකුරු සම නම | | | |
| 03.මුලකුරු සම නම (ඉංග්‍රීසියෙන්) | | | |
| 04. උපන් දිනය<br>YYYY/MM/DD | 05. වයස .(20.... . දිනට):-<br>අවු. මාස. දින. | 06. ජාතික හැඳුනුම්පත් අංකය:- | 07. ස්ත්‍රී/පුරුෂ භාවය:- |
| 08. ස්ථිර ලිපිනය:- | 09. තාවකාලික ලිපිනය:- | 10. දුරකථන අංකය:<br>කාර්යාලය:-<br>පෞද්ගලික:- | |
| 11. විවාහක/ අවිවාහක බව:- | 12. කලත්‍රයාගේ නම:- | 13.කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| 14.දරුවන් ගණන:- | 15. ඔවුන්ගේ වයස:- | 16. ඉගෙනුම ලබන පාසැල:- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 17. පත්වීම් ලිපියේ අංකය:- | 18:- මධ්‍යම පළාත් පුස්තකාලයාධිපති සේවයට පත්වූ දිනය:- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:- | 20.:- සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 21. වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:- | 22. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය:-<br>( 20 . . දිනට)<br>අවු ..... මාස.... දින..... |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015.09.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | |
|---|---|
| 23. ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක සේවය කර තිබේ ද? (ප්‍රියමනාප) | |

| | | | සේවා කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| 24. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |
| | 5 | | | |

| 25. | සේවා ස්ථානය | සේවා ස්ථානය පිහිටි නගරය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

26. ඉහත සඳහන් කර ඇති සේවා ස්ථානවලට අමතරව ඊට ආසන්න සේවා ස්ථානයකට ස්ථානමාරුවීමක් ලබා දෙන්නේ නම් එයට එකඟද?

27. ස්ථානමාරු ඉල්ලුම් කිරීමට හේතු:- ( නිලධාරියාගේ හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්ත්වයකින් පෙලෙන්නේ නම් ඒ බවට වෛද්‍ය සහතිකවලින් තහවුරු කිරීමට යටත්ව මෙහි සඳහන් කරන්න)

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.......................................                                        ...............................................

දිනය                                        අත්සන

---

ඇ.        අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ:-

- ඉහත නම සඳහන් නිලධාරියාගේ ස්ථානමාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව/ පසුව ලබාදීමේ පදනම මත නිර්දේශ කරමි.

.......................................                                        ...............................................

දිනය                                        අත්සන

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/04/23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්